11
පාඩම

# සේඛියා - III

## සේඛියා දහමින් හුරු පුරුදු වෙමු සුසිරිත් - 3

### සුරු සුරු වර්ගය

සුරු සුරු වර්ගයේ දී පළමුවන ශික්ෂාපද හයේ සඳහන් වන්නේ දානය වැළඳීම පිළිබඳ ව යි. ඒවා ඔබ දෙවැනි පන්තියේ දී හදාරා ඇත. ඉතිරි ශික්ෂා පද හතර මෙහි දැක් වේ. ඒ ධර්ම දේශනා කිරීම සම්බන්ධව ය.

### දහම් දෙසීම පිළිබඳ ශික්ෂා පද

දහම් දෙසීමේ දී දේශකයන් වහන්සේ මෙන් ම ශ්‍රාවක ගිහියන් ද දැනගතයුතු කාරණා රාශියක් මෙහි ශික්ෂා පද දහයකින් දක්වා තිබේ. ධර්ම දේශනා කිරීමේ දී ශ්‍රාවකයා ශාස්තෘවරයාට, ධර්මයට, දේශකයාට, ගරු සරු නොකරයි ද දහම් නොදෙසිය යුතු ය. එසේ ම අවිආයුධ වැනි දෑ ගෙන සිටින අයට දහම් දෙසන්නට යෑම අවදානම් සහගත ය. මේ ශික්ෂා පදවලින් දැක්වෙන්නේ දේශකයන් මෙන් ම ශ්‍රාවකයන් ඒ පිළිබඳ ව දැනුවත් විය යුතු බව යි.

### සුරු සුරු වගගය - පෙළ සහ තේරුම

07. **න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
    කුඩයක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

08. **න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
    දණ්ඩක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

09. **න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
    කඩුවක් අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

10. **න ආවුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
    ආයුධ අතින් ගෙන සිටින නොගිලන් තැනැත්තාට දහම් නො දෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**පාදුකා වගගය**
**(ධර්මදේශනා ප්‍රතිසංයුක්ත හා මළමුත්‍රා කිරීම පිළිබඳ)**

සත්වැනි වර්ගය පාදුකා වර්ගය යි. 'පාදුකා' යනු පාවහන් ය. සම්වලින් හෝ ලීවලින් පාදුකා සාදනු ලැබේ. මෙහි සේඛියා දොළසක් ම ධර්මදේශනා ප්‍රතිසංයුක්ත සේඛියාවෝ ය. ලෙඩෙක් නොවන්නා වූ මිරිවැඩි පයලා සිටින්නකුට, රියක නැගී සිටින්නකුට, බිම වුව ද වැතිර සිටින්නාට (පල්ලත්ථිකායෙන) සිටින්නකුට, කේශාන්තය නොපෙනෙන සේ ජටා බැඳ සිටින්නකුහට ද යනාදී වශයෙන් නොගැලපෙන චර්යාවන් ප්‍රදර්ශනය කරන්නවුන්ට දහම් නොදෙසිය යුතු ය. ඉහත සඳහන් පුද්ගලයන් ගිලන් පුද්ගලයන් නම් එම ඉරියව්වෙන් සිටිද්දී ධර්ම දේශනා කිරීමේ වරදක් නැත. සදාචාරාත්මක බව, ධර්ම ගෞරවය, අවධානය ආදී කරුණු මෙහි දී සලකා ඇති බව පෙනේ.

තණබිම හා ජලය උසස්ම පාරිසරික සම්පත් දෙකකි. තණකොළ පසේ ආරක්ෂාව සපයයි. පරිසරය අලංකාර කරයි. පිරිසිදු වාතාශ්‍රය සපයයි. සතුන්ට ආහාරයක් වෙයි. මිනිසුන්ට හිඳ ගැනීමට, විවේක ගැනීමට ආසනයක් සේ ද භාවිත වේ. එහි මළ මුත්‍රා හෝ කෙළ ගැසීමෙන් ඒවා අපවිත්‍ර වෙයි. දුගඳ වෙයි. මේ නිසා එහි මළ මුත්‍රා කිරීම කෙළ ගැසීම නොකළ යුතු ය. බුදුරජාණන් වහන්සේ තණ බිමක ඉඳුල් බත් නොතබන ලෙස කසීභාරද්වාජ සූත්‍රයේ දක්වා තිබේ. ජලය, බීමට, නෑමට සහ තවත් කොතරම් දේට ප්‍රයෝජනවත් වේ ද යන්න අමුතුවෙන් කිව යුතු නැත. එහි මළමුත්‍රා කිරීම කෙළ ගැසීම කිසිසේත් නොකළ යුතු ය. එසේ කිරීම මිත්‍රද්‍රෝහී ක්‍රියාවක් වන්නේ ය.

**පාදුකා වගගය - පෙළ සහ තේරුම**

**01. න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
මිරිවැඩි පය ලා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**02. න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
පාවහන් පය ලා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**03. න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
රියක නැගී සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**04. න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
වැතිරී සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**05. න පල්ලත්ථිකාය නිසින්නස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
දණහිස් පල්ලත්ථිකාවෙන් බැඳ හිඳින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

**06. න වේඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
ජටාවෙන් හිස වෙලාගෙන සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

07. **න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
හිස වසා පොරවා සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

08. **න ඡමායං නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා බිම ඉඳගෙන අසුනක හිඳින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

09. **න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා පහත් අසුනක හිඳ උස් අසුනක හිඳින සිටින නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

10. **න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
තමා සිටගෙන සිටිමින් හිඳගෙන ඉන්නා නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

11. **න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී'ති සික්ඛා කරණීයා**
පිටුපසින් යමින් තමාට ඉදිරියෙන් යන නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

12. **න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා**
තමා මගට පිටින් යමින් මග යන නො ගිලනාට දහම් නොදෙසන්නෙමි'යි හික්මිය යුතු ය.

13. **න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් ජලයෙහි මළ මුත්‍ර කිරීම හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

14. **න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් සිටගෙන මළ මුත්‍ර හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

15. **න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා**
නොගිලන් තැනැත්තා විසින් තණකොළ ආදිය ඇති බිම මළ මුත්‍ර හා කෙළ ගැසීම නො කරමියි හික්මිය යුතු ය. නොගිලන් තැනැත්තා විසින් ජලයෙහි මළ මුත්‍ර කිරීම හා කෙළ ගැසීම නො කරන්නෙමි'යි හික්මිය යුතු ය.

**අභ්‍යාස**

01. භික්ෂු සංස්ථාවෙහි පැවැත්මෙහි ලා සේඛියාවන්හි වැදගත්කම අගයන්න.
02. ධර්ම දේශනාවක දී අනුගමනය කළයුතු සිරිත්-විරිත් පෙන්වා දෙන්න.
03. සේඛියා අර්ථ සහිතව වනපොත් කරන්න.

**පුහුණුවට**

සමත විදසුන් ධර්මයෙහි වෙසුනේ
නොනැවතී ඉන් මතු ද සිහි කෙරුනේ
දහම් බෝපැකි සිත් පුරා පිරුනේ
ඒ මහණ තෙම නොමැත පිරිහුනේ

(භික්ඛු වග්ගය-05 ගාථා)